# ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ශ්‍රී ලංකා විදේශ රැකියා අමාත්‍යාංශය

## ජපානයේ රැකියා අවස්ථා සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය

විදේශ රැකියා අමාත්‍යාංශය ,ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ IM ජපන් ආයතනය (International Manpower Development Organization) සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ජපානයේ රැකියා අවස්ථා සඳහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් යොමුකිරීමේ වැඩසටහනට අදාලව ශ්‍රමිකයින් බඳවා ගැනීමට 2018.09.30 දින සිළුමිණ පුවත්පතෙහි සහ කාර්යාංශ වෙබ් අඩවියේ දැන්වීමක් පල කරන ලදී.

ඒ අනුව අදාල දැන්වීමෙහි සඳහන් රැකියා කාණ්ඩ සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ කටයුතු 2018.10.09 දින පෙ.ව.7.00 ට පැලවත්ත බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටයුතු සූදානම් කර ඇත. අදාළ රැකියා කාණ්ඩය සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ඔබ පහත ලිපිලේඛන සහිතව, දන්වා ඇති පරිදි සූදානම් වී නියමිත ස්ථාන වෙත යොමු වන ලෙස මෙමගින් දන්වා සිටිමු.

2018.10.09 වන දින රැගෙන ආ යුතු ලිපිලේඛන හා අනෙකුත් දෑ,

1. තම අනන්‍යතාවය සහතික කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු ගමන් බලපත්‍රය
2. අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා Track Bottom,සුදු පැහැති T-Shirt හා කැන්වස් සපත්තු පැළඳිය යුතුය.
3. අයදුම්කරුවන් ශාරීරික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු මගින් ලබාගත් වෛද්‍ය සහතිකයක් (Medical Fitness Certificate) රැගෙන ආ යුතුය.
4. වෙබ් අඩවියේ පලකරන ලද අයදුම්පත සම්පූර්ණකර රැගෙන ආ යුතුය.
5. සාත්තුසේවිකා රැකියා කාණ්ඩය සඳහා ජපන් භාෂා ප්‍රවීණතා JLPT Level 4/NAT Level 4 හෝ ඊට ඉහල සුදුසුකම් පිළිබඳ සහතික හා ඒවායේ ඡායා පිටපත් රැගෙන ආ යුතුය.
6. කළු පෑනක් රැගෙන ආ යුතුය.

**ස්ථානය - බුද්ධදාස ක්‍රීඩාංගනය - පැලවත්ත බත්තරමුල්ල වේලාව - පෙ.ව.7.00**

2018.10.09 දින යෝග්‍යතා පරීක්ෂණය අවසන් වූ පසු ගණිත හැකියාව හා ජපන් භාෂා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීමට නියමිත බැවින් පහත ලිපිනයෙහි පිහිටි කාර්යාංශ විගමණික පුහුණු මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතුය.

ලිපිනය -ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ,විගමණික පුහුණු මධ්‍යස්ථානය ,241/1,පරණ පාර, පන්නිපිටිය

**සැලකිය යුතුයි - සියළුම පරීක්ෂණ වලින් සමත් අයදුම්කරුවන් මාස 04ක පූර්ණ කාලීන නේවාසික පෙර විගමණික පුහුණුවක් (ජපානයේ රැකියා සඳහා පිටත්ව යාමට පෙර) සම්පූර්ණ කලයුතු බැවින් මේ වන විට රැකියා වල නියුතු අය මේ සඳහා ඉල්ලුම්කර ඇත්නම් එයද සැලකිල්ලට ගත යුතු බව අවධාරණය කරමු.**

වැඩි විස්තර සඳහා ,

කළමණාකරු , අලෙවිකරණ හා බඳවාගැනීම්(සාමාන්‍ය)

දු.අ 0112791814 /011-4388294 /0114388295 විද්‍යුත් තැපැල - ao2_mkt@slbfe.lk / off1_mkt@slbfe.lk